1978 - 8 - 8

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 32 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 ජූලි මස 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 32 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 25 වන දින]

එල්. ඩී.—ඔ. 19/77.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 32 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 2 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 434 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) මේ ආඥාපනතේ කාර්ය සඳහා උප තැපැල් ස්ථානාධිපති තනතුර දරන තැනැත්තකු ආණ්ඩුවේ සේවයෙහි විශ්‍රාම වැටුප් නොලබන සේවා නියුක්තයකු ලෙස සලකනු ලැබිය යුතු අතර එවැනි තැනැත්තකුට වේතන වෙනුවට ගෙවනු ලබන මාසික දීමනාව මාසික වේතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ඒ 34712 — (78/07